ඉන්දීය කාන්තාවක්, ශ්‍රී ලාංකීය විවාහක කාන්තාවක් සමගින් ඇති කොටගෙන තිබූ සබඳතාවයක් සහ, ශ්‍රී ලාංකික කාන්තාවගේ පියා කළ පැමිණිල්ල මත ඔවුන්ව අත්අඩංගුවට ගැනීමත්, පසුව ඉන්දීය තරුණිය මුදා හැරීමත් පිළිබඳව මාධ්‍ය වාර්තා කර තිබිණි. එය සිංහල භාෂා පුවත්පත් තුළ වාර්තා වී තිබූ ආකාරයේ ගැටළු සම්බන්ධයෙන්, Ethics Eye මින් පෙර පෝස්ටුවක් ඔස්සේ සාකච්ඡාවට ගෙන තිබිණි.

"සිය ශ්‍රී ලාංකික පෙම්වතිය විවාහ කරගැනීමට පැමිණි ඉන්දීය කත මුදා හැරේ (පරිවර්තනය)" යන සිරස්තලය ද සමගින් තමිලන් පුවත්පතේ (ජූනි 28, 2022) පළව තිබූ පුවත් වාර්තාව ද අපගේ නිරීක්ෂණයට බඳුන් විණි.

මෙම පුවත් අන්තර්ගතය තුල එක් තැනක "මුස්ලිම්" යනුවෙන් ද, තවත් තැනක "දමිළ" යනුවෙන් ද පුවතට අදාළ පුද්ගලයින්ගේ වාර්ගිකත්වයන් හැඳින්වී තිබිණි. එසේම, මේ පිළිබඳව මින් පෙර වාර්තා කර තිබූ සිංහල භාෂා පුවත්පත් තුළ, අදාළ පුද්ගලයන්ගේ වාර්ගිකත්වය පිළිබඳව සඳහන් කර නොතිබූ බවද කිව යුතු වේ.

පුවතක් වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගම පිළිබඳ විස්තර, පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වළකින ලෙසින්, දෙස් විදෙස් මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් මාධ්‍යවේදීන්ට උපදෙස් ලබා දේ. ඊට ප්‍රධානතම හේතුව වන්නේ, පුවතට අදාළ නොවන සෘණාත්මක සන්දර්භයන්හි වාර්ගිකත්වයන් හෝ ආගම සඳහන් කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් හෝ ආගම සෘණාත්මකව ඒකාකෘතික වීමේ අවදානමයි.
එසේ නම් ඔබ සිතන ආකාරයට,

1) මෙම "මුස්ලිම්" හෝ "දමිළ" වාර්ගිකත්වයන් මෙම පුවතට අදාළ වන්නේ කෙසේද?

2) එම වාර්ගිකත්වයන් පුවතට අදාළ නොවන්නේ නම්, එවැනි විටක වුව එම වාර්ගිකත්වයන් සඳහන් කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයට අයත් ප්‍රජාවන් දෙස සෘණාත්මක කෝණයකින් බැලීමට ඇතැමෙකු නොපෙළඹෙන්නේ ද?

3) ඒ ඔස්සේ, වාර්ගිකත්වය පදනම් කොටගත් කොන් කිරීම් ද ඇති නොවනු ඇතිද?

සෘණාත්මක සන්දර්භයන් තුළ අදාළ නොවන වාර්ගිකත්වයන් ඉස්මතු නොකරමු!

මේ පිළිබඳව මින් පෙර Ethics Eye ඉදිරිපත් කළ පෝස්ටුවට
සබැඳිය: **https://www.facebook.com/228455347509530/posts/1707871862901197/**